පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 5, අංක 5 2002 මාර්තු - අප්‍රේල්

# පැපොල් පැළ නිපදවීමට පරිසර හිතකාමී තාක්ෂණයක්

පැපොල් වසර පුරා ඵලදාව ලබාදෙන ජනප්‍රිය බෝගයකි. මෑතක් වන තුරු පැපොල් වගාව තෙත් කළාපයට සීමා වී තිබුණි. නමුත් දියුණු කරන ලද දේශීය හා විදේශීය ප්‍රභේද සමග නවීන ජල සම්පාදන පහසුකම් යටතේ වානිජමය වගාවන් වියළි කළාපය තුළ ව්‍යාප්ත වෙමින් පවතී.

පැපොල් බීජ කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවීමට වඩා බීජ මගින් සකසාගත් පැළ ක්ෂේත්‍රයේ සිටුවීම වඩාත් බහුලව භාවිතා වන ක්‍රමයයි. බිජ පැළ පළමුව වැලිතවාන් වල දමා පසුව පොලිතීන් බඳුන්වලට මාරු කිරීම සිදු කරයි. ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු අවස්ථාවට පත්වූ බඳුන්ගත පැළ, පොලිතීන් බඳුන ඉවත් කර ක්ෂේත්‍රයේ සිටුවීම කරයි.

මෙම ක්‍රියාදාමයේ දී අවස්ථා 2 කදී එනම් වැලි තවානෙන් මාරු කරන අවස්ථාව හා ක්ෂේත්‍රයේ සිටුවන අවස්ථාවේදී මුල් වලට හානි වීමට ඇති හැකියාව වැඩිය. හානි වූ මුල් ව්‍යාධිකාරකයින් ශාකයට ඇතුල්වීම සඳහා උපකාරි වේ. පිතියම්, පියුසාරියම් සහ පයිටොප්තෙරා විශේෂ මගින් පාමුල කුණුවීම සහ බීජ පැළ මැලවීම පැපොල් පැළ වලට කුඩා අවධියේ දී ඇතිවන ප්‍රධාන රෝගී තත්වයන් වේ. මෙම රෝග සාමාන්‍යයෙන් පළතුරු පැළ වලට ආසාදනය නොවේ.

මේ නිසා මුල මණ්ඩලයට සිදුවන හානි සම්පූර්ණයෙන් ඉවත් කිරීමට පහසු ක්‍රමයක් අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් හඳුන්වා දී ඇත. මෙහිදී සෙ.මී. 20 ක් දිග හා සෙ.මී. 12 ක් උස කඩදාසියේ දෙකෙළවර ඇලවීමෙන් කඩදාසි බඳුන සකසා ගනු ලැබේ (රූපය බලන්න).




මෙම බඳුනට වැලි : මතුපිට පස්: කොම්පෝස්ට් 1:1:1 මිශ්‍රණය පුරවා කැප්ටාන් හෝ තිරාම් යොදා බිජ ප්‍රතිකාර කර එක බඳුනක එක් බීජය බැගින් සිටුවනු ලැබේ.

බිජ පැළ වනතෙක් සෙවන සහිත ස්ථානයක බඳුන් තබා ක්‍රමයෙන් සූර්යාලෝකයට නිරාවරණය කරමින් ක්ෂේත්‍ර සංස්ථාපනයට පෙර පැළ දැඩි කිරීම කල යුතු වේ. බීජ පැළ බඳුන සමගම සිටුවන අතර කඩදාසිය සති කීපයකින් දිරා යයි. මෙම ක්‍රමය මගින් මුල මණ්ඩලයට හානි සිදු නොවන අතර ක්ෂේත්‍ර සංස්ථාපනය හොඳින් සිදු වේ. සාමාන්‍යයෙන් පිරිමි මල් සහිත ශාක හටගන්නා බැවින් එක් තැනක පැළ 3 ක් (බඳුන් 3 ක්) සිටුවා පසුව පිරිමි මල් හට ගන්නා පැළ ඉවත් කරනු ලැබේ. බඳුන් ඉවත් කිරීමක් සිදු නොවන බැවින් පැළ සිටුවීම සඳහා ගතවන කාලයද ඉතිරි වේ. කඩදාසි බඳුන් පැළ භාවිතයේ වාසි පිළිබඳ සංසන්දනයක් පහත දැක් වේ.

**වගුව : කඩදාසි බඳුන් පැළ හා පොලිතීන් බඳුන් පැළ පිළිබඳ සංසන්දනය**

| | කඩදාසි බඳුන් | පොලිතින් බඳුන් |
|---|---|---|
| පැළ සිටුවීමෙන් දින 14 කට පසු ක්ෂේත්‍රයේ තිබූ පැළ ගණන | 100% | 70% |
| ක්ෂේත්‍රයේ සිටවීමට ගත වූ කාලය | බඳුන් 3 ක් සිටුවීමට මිනිත්තු 1 | බඳුන් 3 ක් සිටුවීමට විනාඩි 3 ක් |
| අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 1 කින් සැකසිය හැකි බඳුන් ගණන | 465 | 575 |
| බඳුන් 1000 කට වියදම | රු. 43.00 (පත්තර කඩදාසි කි.ග්‍රෑම් 1 ක් රු. 20.00 බැගින්) | රු. 141.00 (පොලිතින් කි.ග්‍රෑම් 1 ක් රු. 110.00 බැගින්) |

කෙසේ නමුත් කඩදාසි බඳුන් භාවිතයේ සීමාකාරී සාධකයන්ද වේ. කඩදාසි බඳුන් දුර ප්‍රවාහනයේ දී හා භාවිතයේ දී පහසුවෙන් බිඳීයාම සිදුවිය හැක. මේ නිසා තවාන් පැළ ක්ෂේත්‍රයට ආසන්න ස්ථානයක සැකසීමෙන් ප්‍රවාහන හානි අවමකර ගත හැක. තවද වේයන්ගෙන් බඳුන් වලට හානිවීම සිදුවන බැවින් ඒ සඳහා ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය අවශ්‍ය වේ. සිමෙන්ති මතුපිටක් මත හෝ පොලිතීන් ඇතිරූ ඇලුමිනියම් තැටි මත හෝ බීජ පැළ බඳුන් තැබීම කළ හැකිය.

*මූලාශ්‍රය : ආචාර්ය සුජාතා වීරසිංහ, පර්යේෂණ නිලධාරිනී මාංශ බෝග සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

# සැකසූ ඉදුනු තක්කාලි පිළිකා ඇතිවීම අඩු කරයි.

කැරටිනොයිඩ සහිත ආහාර අනුභවයෙන් මිනිසුන් තුළ පිළිකා ඇතිවීම අඩු කරන බව සොයා ගෙන ඇත. කහ, තැඹිලි, රතු සහ කොළ වර්ණක සහිත ශාක ද්‍රව්‍ය වල කැරටිනොයිඩ අඩංගු වේ. කැරට්, වට්ටක්කා, කොළ එළවළු, ඉදුනු පැපොල්, අඹ සහ තක්කාලි පහසුවෙන් සොයා ගත හැකි කැරටිනොයිඩ බහුල එළවළු, පලතුරු අතරට ගැනේ.

මෙම කැරටිනොයිඩ අතුරින් ලයිකොපින් නැමති කැරටිනොයිඩයමට පිළිකා තත්ව ඇතිවීම වැලැක්වීමේ ඉහල ගුණාත්මයක් ඇති බව ඇමරිකාවේ පර්යේෂකයන් හඳුනාගෙන ඇත.

අපට ලයිකොපින් ලබාගත හැකි වනුයේ ලයිකොපින් බහුල ආහාර ආහාරයට ගැනීමෙනි. අපගේ ප්‍රධානතම ලයිකොපින් අඩංගු ආහාරය තක්කාලි වේ. අපගේ ශරීරයට ලයිකොපින් පහසුවෙන් අවශෝෂණය කර ගත හැකි වනුයේ අලුත් තක්කාලිවලට වඩා සැකසූ තක්කාලි නිෂ්පාදන වන තක්කාලි පල්පය, සෝස් වැනි ආකාර වලිනි.

*මූලාශ්‍රය : ආචාර්ය එස්.එෆ්. හුසේන් මිය, පර්යේෂණ නිලධාරිනි, ආහාර පර්යේෂණ ඒකකය, ගන්නොරුව.*

# කැරට් මුලෙහි තැඹිලි පැහැය

කැරොටින් යනු හයිඩොකාබනයක් සහ විටමින් වල පූර්ව විටමිනයක් (precursor) වන අතර කැරට් මුලෙහි කහ පැහැයට හේතුව එහි කැරොටින් අඩංගු වීම වේ. තැඹිලි පැහැයේ තීව්‍රතාව අනුව එහි ඇති කැරොටින් ප්‍රමාණය තීරණය වේ. අඩු උෂ්ණත්වය කැරොටින් නිපදවීමේ ක්‍රියාවලිය වැඩි කරයි. පහතරට වැවෙන කැරට් වලට වඩා උඩරට වැවෙන කැරට් වලට වඩා ආකර්ශනීය වනුයේ මෙම හේතුව නිසාවෙනි. කෙසේ නමුත් විවිධ කැරට් ප්‍රභේද වල කැරොටින් නිෂ්පාදන ප්‍රමාණය දෙන ලද උෂ්ණත්වය අනුව වෙනස් වේ.

*මූලාශ්‍රය : ඒ. පාලමකුඹුර මයා, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්. හා සං.ආයතනය, ගන්නොරුව.*

# ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාව සඳහා වගා මාධ්‍ය

පස් භාවිතා කිරීමේ දී මතුවන විවිධ ගැටළු මඟ හරවා ගැනීම සඳහා ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාව සඳහා විවිධ වගා මාධ්‍ය භාවිතා කරනු ලැබේ. ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් කරන ලද පර්යේෂණයන්ට අනුව පහත සඳහන් වගා මාධ්‍යයන් ආරක්ෂිත ගෘහ තුළ වගාව සඳහා භාවිතා කිරීමට සුදුසු බව හඳුනාගෙන ඇත.

- කර කරන ලද දහයියා (Smoked paddy husk)
- කර කරන ලද දහයියා සහ පයිනස් පොතු කැබලි
- කර කරන ලද දහයියා සහ කොහුබත් 1:1 මිශ්‍රණය
- කොහුබත්

*මූලාශ්‍රය : බී. ජිවානාදන් මයා, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# එළවළු වගාව හා පාංශු පී එච් අගයයන්

පාංශු පී එච් අගය මගින් එම පසේ ආම්ලිකතාව හෝ භාෂ්මිකතාව පෙන්නුම් කරයි. සෑම එළවළු බෝගයක් සඳහාම, එය වඩා හොඳින් වර්ධනය වන පී එච් පරාසයක් තිබේ. කෙසේ නමුත් සියළුම එළවළු පොදුවේ පී එච් 6.0-6.5 පරාසය තුළ හොඳින් වගා වේ. මෙම පරාසය තුළ පස සුළු ලෙස ආම්ලික වන අතර සියලු පෝෂක ලබාගත හැකි බව සඳහා යෝග්‍ය වන බැවින් එළවළු හොඳින් වැවේ. කෙසේ නමුත් පී එච් 5.0-8.0 පරාසය තුළ එළවළු වගා කළ හැකි වේ.

පාංශු පී එච් පරාසය යෝග්‍ය නොවන විට බෝග විවිධ පෝෂක ඌනතා, විෂවීම් සහ විවිධ පාංශු ජනක රෝග වලින් පීඩාවට පත් වේ. පී එච් අගය අඩු තත්වයකදී සමහර දිලීර බහුල ලෙස බෝග

ආසාදනය කරයි. ගෝවා සහ මල්ගෝවා වගාවන් දරුණු ලෙස ආසාදනය කිරීමට ගෝවා බරවා පාද රෝගය ඇති කරන ප්ලැස්මොඩියෝෆෝරා බැසිකේ දිලීරයට අඩු පී එච් තත්වයන්හිදී හැකි වේ. මෙම තත්වය මග හරවා ගැනීම සඳහා ගෝවා සහ මල් ගෝවා වගා කිරීම සඳහා පස උදාසීන පරාසයක තිබීම අවශ්‍ය වේ.

අඩු පී එච් එනම් ඉහළ ආම්ලිකතාවයෙන් යුත් පසෙහි ඇලුමිනියම් සහ මැංගනීස් ලබා ගත හැකි බව ඉහළ යන බැවින් එය සමහර එළවළු සඳහා විෂවීමේ තත්වයට පත් වේ. බීට්, සෙලරි යන බෝග ඇලුමිනියම් විෂවීමට වඩාත් සංවේදී වන අතර බෝංචි, ගෝවා මැංගනීස් වලට වඩා සංවේදී වේ. මේ නිසා එවැනි බෝග අඩු පී එච් තත්ව එනම් අධික ආම්ලික තත්ව සහිත පස් වල වගා කිරීම අපහසු වේ.

*මූලාශ්‍රය : ඒ පාලමකුඹුර මයා, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# දිවුල් වර්ධනක ප්‍රචාරණය

වියළි කලාපීය ප්‍රදේශවල බහුලව කැලෑබදව වැවෙන දිවුල් (ලිමෝනියා ඇසිඩිසිමා L.) ශාකය එතරම් අවදානයට ලක් නොවූ බෝගයකි. එයටම ආවේනික වූ රසයකින් යුක්ත අතර වියළි කලාපීය ශුෂ්ක තත්වයන්ට හොඳින් ඔරොත්තු දීමේ හැකියාව ඇත.

දිවුල් සාමාන්‍යයෙන් බීජ මගින් ප්‍රචාරණය කරයි. බීජ මගින් පැළ කල ශාක එල දැරීම සඳහා අවුරුදු 10 ක් පමණ ගත වේ. එයට හේතුව බීජ පැළ වල මුල් කාලයේ වර්ධනය ඉතා සෙමෙන් සිදුවීමයි. කෙසේ නමුත් වර්ධකව ප්‍රචාරණය කල දිවුල් ශාක අවුරුදු 5 කින් පමණ එල දැරීම සිදු වේ. මේ නිසා හඳුනාගත් හොඳ ලක්ෂණ සහිත දිවුල් ශාක ප්‍රචාරණය සඳහා වර්ධක ප්‍රචාරණය වැදගත් වේ.

වඩාත් යෝග්‍ය වර්ධක ප්‍රචාරණ ක්‍රමය තෝරා ගැනීම සඳහා 1997 දී මහඉලුප්පල්ලමදීත් 2001 වසරේදී අඟුණකොළපැලැස්සේදීත් පරීක්ෂණ පවත්වන ලදී. මුල් කැබලි, අතු කැබලි, ශාක අග්‍රස්ථ, අංකුර හා රිකිලි බද්ධ කිරීම, අතු බැඳීම යන ක්‍රම භාවිතා කරන ලදී.

මේ ක්‍රම අතුරින් රිකිලි බද්ධ ක්‍රමය 96% ක සාර්ථක භාවයක් පෙන්වූ අතර මුල් කැබලි සහ අතු කැබලි පිළිවෙලින් 16% හා 3% ක සාර්ථක තත්වයන් පෙන්වීය.

ශාක අග්‍රස්ථ, අතු බැඳීම හා අංකුර බද්ධය සාර්ථක භාවයක් නොපෙන්වන ලදී. මේ නිසා දිවුල් වර්ධක ප්‍රචාරය සඳහා භාවිතා කල හැකි වන්නේ රිකිලි බද්ධ ක්‍රමය පමණි.

*මූලාශ්‍රය : ආචාර්ය එස්. වීරසිංහ, පර්යේෂණ නිලධාරිනී සහ කේ.එච්. රුවන්පතිරණ, පර්යේෂණ සහකාර, මාශ බෝග සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, අඟුණකොළපැලැස්ස.*

# කන්ඩුල - ද්විකාර්ය කෙසෙල් ප්‍රභේදයක්

ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය හා බහුලව වගාවෙන පලතුරු බෝගය කෙසෙල් වේ. වර්තමානයේ වගාවෙන නිර්දේශිත එකම කෙසෙල් ප්‍රභේදය "නදී" ලෙස හැඳින්විය හැක. එයද මයිසූර් ආකාර ඉදුනුපසු භාවිතා වන වර්ගයකි. ගොවීන් ආකාර කෙසෙල් ප්‍රභේද වගා කලද එම ආකාර නිර්දේශිත ප්‍රභේද නොමැත. මේ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කැවෙන්ඩිෂ් ආකාරයට බොහෝ සමාන ද්විකාර්ය කෙසෙල් ප්‍රභේදයක් ලෙස කන්ඩුල ප්‍රභේදය 2002 මාර්තු මාසයේ දී නිර්දේශ කරන ලදී. එය පළතුරු ලෙසට මෙන්ම ව්‍යාංජනයක් ලෙසට පිළියෙල කර ආහාරයට ගත හැකි වේ. එමෙන්ම එය චතුර්ගුණ (4n) දෙමුහුම් ප්‍රභේදයකි.

සම්ප්‍රදායික වගා ක්‍රමයට (හෙක්ටයාරයකට පැල 1100 ක් වන ලෙසට) දිවයිනේ විවිධ ප්‍රදේශ වල පවත්වන ලද පර්යේෂණ වලට අනුව ඉතා ඉහළ අස්වැන්නක් ලබා දෙන ලදී.

**වගුව 1 : කන්ඩුල සහ නදී ප්‍රභේද වල අස්වනු දත්ත (අස්වනු වාර 3 කදී)**

| | මවු වගාව | | 1 නිරි වගාව | | 2 වන නිරි වගාව | |
|---|---|---|---|---|---|---|
| | කැනක බර කි.ග්‍රෑම් | අස්වැන්න මෙ.ටො./හෙක්. | කැනක බර කි.ග්‍රෑම් | අස්වැන්න මෙ.ටො./හෙක්. | කැනක බර කි.ග්‍රෑ. | අස්වැන්න මෙ.ටො./හෙක්. |
| නදී | 13.3 | 14.6 | 15.2 | 16.7 | 15.0 | 16.5 |
| කන්ඩුල | 25.5 | 28.0 | 21.5 | 23.7 | 25.8 | 28.4 |

**වගුව 2: කන්ඩුල සහ නදී ප්‍රභේද වල ගුණාත්මක පරාමිතික (ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකය විසින් සිදු කරන ලදී).**

| පරාමිතික | කන්ඩුල | | නදී |
|---|---|---|---|
| | අමු ගෙඩි | ඉදුනු ගෙඩි | ඉදුනු ගෙඩි |
| ගෙඩියක බර (ග්‍රෑම්) | 228.2 | 223.1 | 100.1 |
| ගෙඩියක දිග (සෙ.මී.) | 19.2 | 20.5 | 14.7 |
| ගෙඩියක විශ්කම්භය (සෙ.මී.) | 13.6. | 13.2 | 13.8 |
| මාංශලයේ බර (ග්‍රෑම්) | 154.8 | 106.54 | 77.9 |
| මාංශල වර්ණය | කහ වර්ණය කාණ්ඩය 11D | කහ වර්ණ කාණ්ඩය | කහ වර්ණ කාණ්ඩය 10 A |
| පිට පොත්තේ වර්ණය | කහ කොල කාණ්ඩය 144 A | කහ වර්ණ කාණ්ඩය | කහ වර්ණ කාණ්ඩය 10 A |
| පී එච් අගය | 5.44 | 4.74 | 4.29 |
| % ආම්ලිකතාවය (සිට්‍රික්) | 4.74 | 0.43 | 0.62 |
| බ්‍රික්ස් අගය | 7.5% | 18.5% | 25% |
| වයනය | මෘදු | මෘදු | මෘදු |
| පීසීමේ කාලය (උතුරන වතුරේ) | | | |
| ගෙඩි ලෙල්ල සමග | මිනිත්තු 18 (85 0 C) | | |
| කැපූ පෙති ලෙල්ල සමග | මිනිත්තු 10 (60-80 C ) | | |

ද්විකාර්ය කන්ඩුල ප්‍රභේදයේ බ්‍රික්ස් අගය නදී ප්‍රභේදය හා සංසන්දනය කරන විට අඩු අතර මේ නිසා කන්ඩුල පැණිරස ගතිය තරමක් අඩුය. නමුත් හොඳින් ඉදුනු කන්ඩුල ගෙඩි ඉතා ප්‍රනීත රසයකින් යුතු වේ.

කන්ඩුල ප්‍රභේදය පැළ සිටුවා මාස 6-6.5 කදී පීදේ. ඉදුනු පලතුරක් ලෙසට භාවිතා වන්නේ නම් කැන වැටීමේදී සිට දින 110-120 ක් ගතවන අතර ව්‍යාංජන සඳහා භාවිතා වන්නේ නම් දින 90 කදී අස්වනු නෙලා ගත හැකි වේ. ඉදුනු පලතුරක් ලෙස භාවිතා වේ නම් සම්පූර්ණයෙන් ඉදුනු පසුව භාවිතා කල යුතු වේ.

මෙම ප්‍රභේදයේ කෙසෙල් ගසක් මීටර් 2.1-2.9 ක් පමණ උසට වැවේ. මෙහි කඳ ඉතා ශක්තිමත් වන හෙයින් සුළගට ඔරොත්තු දේ. ව්‍යාජ කඳෙහි පැහැදිලි කළු පැහැති පැල්ලම් දැකිය හැක. මවු ශාකයට ආසන්නව මොරෙයියන් 8 ක් පමණ හට ගනී. පත්‍ර තලයේ මතුපිට තද කොළ පැහැ වන අතර යට කොළ පැහැති වේ. ඇවරියක ගෙඩි 13-16 ක් පමණ හට ගන්නා අතර ගෙඩියක් සෙ.මී. 16-20 ක් පමණ දිගු වේ. ලපටි අවස්ථාවේදී ගෙඩි මධ්‍යම කොළ පැහැයක් ගන්නා අතර ඉදෙන විට කහ පැහැයට හැරේ. ලෙල්ල පහසුවෙන් නොගැලවෙන අතර පරිනත වන විට එල හැලීම සිදු නොවේ. පරිනත වූ පසුව ගෙඩි පහසුවෙන් වෙන්කල හැකි වේ.

කෙසෙල් වගාවට නිර්දේශිත සියලු වගා ක්‍රම මෙම ප්‍රභේදයට භාවිතා කල හැකි අතර එය කෙසෙල් ඉරි වෛරස් රෝගයට හා සිගටෝකා රෝගයට ඔරොත්තු දෙන අතර, තෙතමන විෂමතා දරා ගත හැකිය.
කෙසෙල් වගාව සංවර්ධනය සඳහා ඇති ජාත්‍යන්තර. මියුසා ජාන ප්ලාස්ම හුවමාරු මධ්‍යස්ථාන.
(musa germplasm transit unter of International Network for the Improrement of Banana and Plantains - INIBAP) මගින් මෙම ප්‍රභේදය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී.

*මූලාශ්‍රය : ආචාර්ය එස්. වීරසිංහ, පර්යේෂණ නිලධාරි, ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.